# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2025.11.24** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතු ය.

තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

1. **රියදුරු තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 02]**

**1.1 වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 51,020 - 11 x 590 / 10 x 680 – 64,310/- වේ.

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000/- පමණ වේ).

**1.2 වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**1.3 අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

**1.4 වෘත්තීය සුදුසුකම් :**

බර වාහන ද ඇතුළුව සියලුම පංතිවල මෝටර් වාහන පැදවීම සඳහා බලපත්‍රයක් හිමිව සිටිය යුතුයි. (අයදුම්කරුට වාහනවල එදිනෙදා ඇතිවන සුළු අලුත්වැඩියා කිරීම් කර ගැනීමට හැකියාව තිබිය යුතු අතර මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම ඇති, නිවාඩු දින, සති අන්ත සහ සාමාන්‍ය රාජකාරී වේලාවන්වලින් පරිබාහිරව රාජකාරී කිරීමේ හැකියාව ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)

**1.5 පළපුරුද්ද :**

රාජ්‍ය ආයතනයක / පිළිගත් ආයතනයක රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර 05 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**1.6 බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත/ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

**1.7 පරීක්ෂණ ක්‍රමවේදය :**

අයදුම්පත් අතුරින් බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ මීළඟ අදියරට කැඳවනු ලැබේ.

(අ) ලිඛිත/ ප්‍රායෝගික පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් හෝ තෝරාගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් හෝ ලිඛිත පරීක්ෂණය/ ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලැබේ. එහි දී පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් ඔස්සේ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| *පරීක්ෂණය* | *පරීක්ෂා කරනු ලබන විෂයය ක්ෂේත්‍රයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| ලිඛිත | මාර්ග නීති පිළිබඳ දැනුම/ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම/ සාමාන්‍ය දැනුම | 100 |
| ප්‍රායෝගික | රිය පැදවීමේ නිපුණතාව/ කායික යෝග්‍යතාව | 100 |

(ආ) සම්මුඛ පරීක්ෂණය

ලිඛිත/ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| *අනු අංකය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | වෘත්තීයභාවය සහ අන්තර් පුද්ගල කුසලතා |
| 2 | පළපුරුද්ද |
| 3 | භාෂා කුසලතාවය සහ සන්නිවේදන හැකියාව |
| 4 | ආකල්ප හා පෞරුෂය |
| 5 | සති අන්ත සහ නිවාඩු දිනවල රාජකාරි කිරීමේ හැකියාව |

2. සේවා නියමයන් හා කොන්දේසි

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක, සේවය ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සේවයේ ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

3. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික,
(ඉ) රියදුරු බලපත්‍රයේ පිටපතක්.

4. රාජ්‍ය/පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

5. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

6. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

7. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර,**
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2025 නොවැම්බර් මස 04 දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.